## විශේෂ සටහන 13

## ශ්‍රී ලංකාව තුළ අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දීමේ ව්‍යාපාර නියාමනය කිරීමේ අවශ්‍යතාවය

### හැඳින්වීම

මුදල් ණයට දෙන්නෙකු විසින් සුරැකුමක් සහිතව හෝ රහිතව ණය ගැනුම්කරුවෙකු හට මුදල් පොළියට දීම මුදල් ණයට දීම වශයෙන් අර්ථ දැක්විය හැකිය. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන, සමූපකාර ග්‍රාමීය බැංකු, සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති සහ සමෘද්ධි ප්‍රජා මූලික බැංකු වැනි ආයතන මුදල් ණයට දීමේ ව්‍යාපාරයෙහි නිරත වේ. කෙසේ වෙතත්, ඊට අමතරව පුද්ගල වශයෙන් හෝ තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හෝ සමාගම් ස්වරූපයෙන් අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දෙන්නන් ද මෙම ව්‍යාපාරයෙහි යෙදී සිටියි.

බලපත්‍රලාභී බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන මගින් සිදුකෙරෙන මුදල් ණයට දීමේ කටයුතු නියාමනයට[1] ලක් වුව ද, පෙර කී අවිධිමත් ලෙස මුදල් ණයට දෙන්නන් කිසිදු නියාමන අධිකාරියකින් නියාමනයට ලක් නොවේ. දැනට පවතින නීතිමය රාමුවෙන් ප්‍රධාන වශයෙන්අ වධානය යොමු කර ඇත්තේ මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා වැදගත්වන මූල්‍ය අතරමැදිකරණයේ නියැලී සිටින මූල්‍ය ආයතන වෙත ය. තව ද, 1918 අංක 2 දරණ මුදල් ණයට දීම පිළිබඳ ආඥා පනත (මුදල් ණයට දීම පිළිබඳ ආඥා පනත) මගින් එහි විෂය පථයට ඇතුළත් වන මුදල් ණයට දෙන්නන්ගේ ගනුදෙනුක රුවන් සුරක්ෂිත කිරීම සම්බන්ධව විධිවිධාන පැනවුව ද, එමගින් නිශ්චිත නියාමකයෙකු පැනවීම හෝ මුදල් ණයට දෙන්නන් වෙත බලපත්‍ර නිකුත් කිරීමේ හෝ ඒවා ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවයක් නියම නොකරයි. එසේ හෙයින්, මුදල් ණයට දීම පිළිබඳ ආඥා පනත හරහා යම් සහනයක් අපේක්ෂා කරන ගනුදෙනුකරුවෙකුට සැලකිය යුතු මූල්‍ය හා වෙනත් සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය විය හැකි නීතිමය ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට සිදුවිය හැක.

මෙම පසුබිම තුළ, අවිධිමත් ලෙස රට තුළ ක්‍රියාත්මක වන මුදල් ණයට දීමේ ව්‍යාපාර නියාමනය කිරීම සඳහා විචක්ෂණශීලී නියාමන රාමුවක අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගෙන ඇත. එවැනි නියාමන රාමුවක අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලැබූ ක්ෂේත්‍ර චාරිකා මගින් එක්රැස් කරගත් සාක්ෂිවලින් සහ මුදල් ණයට දෙන්නන් විසින් සිදු කරනලද විවිධ අක්‍රමිකතා හා පාරිභෝගික හිංසනය පිළිබඳව ලැබෙන පැමිණිලි වලින් මනාව යුක්ති සහගත කෙරේ.

1 බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් හා බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනයට ලක් වේ; ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ යෙදී සිටින රාජ්‍ය නොවන සංවිධාන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා මගින් නියාමනයට ලක්වේ; සමූපකාර ග්‍රාමීය බැංකු, සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නියාමනයට ලක්වේ; සමෘද්ධි ප්‍රජා මූලික බැංකු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් නියාමනයට ලක් වේ.

### මුදල් ණයට දීමේ ව්‍යාපාර නියාමනය කිරීමේ වැදගත්කම

(අ) පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් අවිධිමත් ලෙස මුදල් ණයට දෙන්නන් නියාමනය කිරීම වැදගත් වේ. අවිධිමත් ලෙස මුදල් ණයට දෙන්නන් කිසිදු පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසියකට යටත් නොවන බැවින්, එවැනි මුදල් ණයට දෙන්නන්ගේ ගනුදෙනුකරුවන් නිතැතින් අසාධාරණ නියමයන්, කොන්දේසි හා හිංසනයන්ට යටත් වීමට ඉඩ ඇත. එබැවින්, අවිධිමත් ලෙස මුදල් ණයට දෙන්නන්ගේ ගනුදෙනුකරුවන් තුළවිශ්වාසය හා තහවුරුව ගිලිහී ගොස් අවසානයේ දී මූල්‍ය සේවා වෙත ප්‍රවේශයක් නොලැබී යා හැක.

(ආ) වර්තමානය වන විට, අවිධිමත් ලෙස මුදල් ණයට දෙන්නන් විසින් සිය ණය ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කරනු නොලැබේ. එබැවින්, විධිමත් අයුරින් මුදල් ණයට දෙන්නන් හට තම ගනුදෙනුකරුවන්ගේ ණය ලැබීමට ඇති සුදුසුකම තක්සේරු කිරීමේ දී සවිස්තරාත්මක ණය තොරතුරු නොලැබීමට ඉඩ ඇත. තව ද, අවිධිමත් මුදල් ණයට දෙන්නන් විසින් ණය තොරතුරු වාර්තා නොකිරීම, විශේෂයෙන් ණය වාරික පැහැරහැරීමේ ඉතිහාසයක් සහිත සමහර ණය ගැනුම්කරුවන් සිය මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා නියාමනයට ලක් නොවන මුදල් ණයට දෙන ව්‍යාපාර වෙත පිවිසීම දිරිමත් කිරීමක් වේ. ණය ගැනුම්කරුවන් පිළිබඳ නිසි ණය තක්සේරුවක් කිරීමට නොහැකි වීම නිසා එකම ගනුදෙනුකරු වෙත බහු* ණය ප්‍රදානයට හේතු වී අධික ණයගැතිභාවය[2] ඇති වන අතර එය දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම, මන්දපෝෂණය වැඩිවීම, ජීවනෝපාය අහිමිවීම වැනි සමාජ ආර්ථික පිරිවැය වලට හේතු වියහැක.

(ඇ) රට තුළ අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දෙන්නන් විශාල සංඛ්‍යාවක් සිටීම විධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දෙන ව්‍යාපාර අතර දැඩි තරගකාරීත්වයට තුඩු දිය හැකි අතර එහි ප්‍රතිඵල වශයෙන් සදාචාර විරෝධී ක්‍රියාවන් සහ ගනුදෙනුකරුවන්ට හිරිහැර කිරීම් සිදුවිය හැක.

(ඈ) අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දෙන්නන් කිසියම් විධිමත් අධිකාරියක් වෙත වාර්තා කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳව දත්ත එක්රැස් කිරීම අභියෝගයක් ව ඇත.

2 අධික ණයගැතිභාවය, සියළු ණය සම්පූර්ණයෙන් හා නියමිත වෙලාවට ගෙවීමට ඇති නොහැකියාව ලෙස දුප්පතුන්ට උපකාර කිරීම සඳහා වන උපදේශක කණ්ඩායම (CGAP) විසින් අර්ථ දක්වා ඇත. https://www.cgap.org/blog/over-indebtedness-roles-and-responsibilities-all-actors

(ඉ) නියාමනයට ලක්නොවන මුදල් ණයට දෙන ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් පැවතීම, විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ණය ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු ඇති කළ හැක.

### මුදල් ණයට දෙන ව්‍යාපාර නියාමනය සම්බන්ධ කලාපීය අත්දැකීම

පහතින් දැක්වෙන පරිදි කලාපයේ රටවල් කිහිපයක් මුදල් ණයට දීමේ ව්‍යාපාර නියාමනය කරයි.

(අ) මැලේසියාව තුළ සියළුම මුදල් ණයට දෙන්නන් විසින් 1951 මුදල් ණයට දෙන්නන්ගේ පනත (සංශෝධිත) (Moneylenders Act of 1951 (as amended)) යටතේ බලපත්‍රයක් ලබාගත යුතුය. මුදල් ණයට දීමේ ව්‍යාපාරවල ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතභාවය ද ඇතුළුව එම ව්‍යාපාර නියාමනයට අදාළ ප්‍රතිපාදන මෙම මුදල් ණයට දෙන්නන්ගේ පනත හරහා සම්පාදනය කර ඇත.

(ආ) බංගලාදේශය තුළ ක්ෂුද්‍ර ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ක්ෂුද්‍ර ණය නියාමන අධිකාරියවෙතින් 2006 අංක 32 දරණ ක්ෂුද්‍ර ණය නියාමන අධිකාරිය පනත (Micro Credit Regulatory Authority Act, No. 32 of 2006) යටතේ බලපත්‍රයක් ලබා නියාමනයට ලක්විය යුතුය.

(ඇ) පිලිපීනයේ මහ බැංකුව විසින් ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ දෘෂ්ටි කෝණයෙන් ණය දීමේ දී සත්‍යය ප්‍රකාශ කිරීමේ පනත, ජනරජ පනත අංක 3765 (Truth in Lending Act, Republic Act No' 3765) යටතේ ණය දෙන්නන්ගේ ව්‍යාපාර නියාමනය කරයි.

(ඈ) ඉන්දීය මහ බැංකුව (The Reserve Bank of India) විසින් පද්ධතිමය වශයෙන් වැදගත්, තැන්පතු භාර නොගන්නා බැංකු නොවන මූල්‍ය ආයතන 1934 ඉන්දීය මහ බැංකු පනත (Reserve Bank of India Act of 1934) යටතේ නියාමනය කරනු ලබයි.

### යෝජිත ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත

පෙර සඳහන් කරන ලද ගැටළු සඳහා විසඳුම් සෙවීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත බලාත්මක කිරීමට යෝජනා කර ඇත. මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජිත ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත මගින් මුදල් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කළ යුතු ව්‍යවස්ථාපිත අධිකාරියක් ලෙස ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පිහිටුවීම යෝජනා කරයි. මුදල් අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ තම නිල බලයෙන් පත්වන නියෝජිතයින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා විසින් හා මුදල් අමාත්‍යතුමා විසින් නම්කරන පුද්ගලයින්ගෙන් මෙම අධිකාරිය සමන්විත වන අතර එයට ක්ෂුද්‍රමූල්‍ය ආයතන හා නියාමනයට ලක් නොවන මුදල් ණයට දෙන්නන් නියාමනය කිරීමට අවශ්‍ය බලතල ලබා දීමට යෝජනා කර ඇත. යෝජිත ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත මගින් තවදුරටත් ක්ෂුද්‍රමූල්‍ය හා මුදල් ණයට දෙන ව්‍යාපාරවල තොරතුරු ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කිරීම සඳහා ද, 2016 අංක 6 දරණ ක්ෂුද්‍රමූල්‍ය පනත අවලංගු කර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ද ප්‍රතිපාදන පනවයි.

### සමාප්ති සටහන්

අධික ණයගැති බව, ණය තොරතුරු නොමැතිකම සහ ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිත බව තහවුරු නොවීම වැනි අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දෙන්නන් හා සම්බන්ධ ගැටළු වෙත ප්‍රමුඛතා පදනමක් මත විසඳුම් සෙවීම ආරම්භ නොකළහොත් එය සැලකිය යුතු සමාජ ආර්ථික පිරිවැයකට තුඩු දිය හැක.

එම සන්දර්භය තුළ, අවිධිමත් ලෙස රට තුළ ක්‍රියාත්මක වන මුදල් ණයට දීමේ ව්‍යාපාර සම්බන්ධව හඳුනාගෙන ඇති ගැටළු සඳහා පිළියම් සෙවීමට යෝජිත ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත පිටිවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නියාමන පරස්පරයකට තුඩු දිය හැකි බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ලියාපදිංචි ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන නියාමකයින් දෙදෙනෙකු මගින් නියාමනය වීම, ක්ෂුද්‍ර ණය දෙන ආයතන මගහැර තැන්පතු භාර ගන්නා ක්ෂුද්‍රමූල්‍ය සමාගම් පිළිබඳ අවධානය යොමු කිරීම සහ ගනුදෙනුකරුවන් සුරක්ෂිත කිරීම පිළිබඳ ප්‍රතිපාදන නොමැති වීම වැනි ක්ෂුද්‍රමූල්‍ය පනතේ යම් යම් අඩුපාඩුවලට යෝජිත ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරිය පනත හරහා විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.